# ශ්‍රී ලංකාවේ අහිකුණ්ඨික සමාජයේ වෙනස් වීම හා එහි ප්‍රතිවිපාක (තඹුත්තේගම ප්‍රදේශයේ කුඩාගම අහිකුණ්ඨික ගම්මානය ආශ්‍රයෙන්)

වයි. එම්. එස්. පියුමන්ති යාපා, ජී. ජී. ඩී. එස්. බණ්ඩාර, එස්. ඒ. ඩී. එස්. අමරසිංහ, සේපාල සමරසේකර*
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
*sepalasamarasekara@gmail.com

අහිකුණ්ඨික යනු සංචාරක ජීවිතයක් ගත කරමින් තාවකාලික වාසස්ථානවල ජීවත්වූ තෙලිගු භාෂාව කතා කරන, ජීවනෝපායන් වශයෙන් නයි රිලවුන් නැටවීම, සාස්තර කීම, ගුරුකම් කිරීම, දඩයම, සිගමන ආදිය සිදු කළ ජන කණ්ඩායමකි. මොවුහු ඉන්දියාවේ දකුණු හා වයඹ ප්‍රදේශ වලින් සංක්‍රමණය වී ඇත. කොරවර් නම්වූ ඉන්දියානු සංචාරක ගෝත්‍රික ජනතාවගේ ශාරීරික ලක්ෂණ වලට සමානකමක් දක්වති. වර්තමානයේ තඹුත්තේගම කුඩාගම ගම්මානය පදනම් කරගෙන ජීවත්වන මෙම ජනතාව පිළිබඳ සිදුකල මෙම පර්යේෂණයේදී නිවාස 25ක පමණ නියැදියකින් ප්‍රශ්නාවලියක් යොමු කොට අදාල තොරතුරු ලබා ගැනිණි. ඔවුන්ගේ සාම්ප්‍රදායික සංස්කෘතික තත්ත්වයන් හා එහි වර්තමාන ස්වභාවය, අද වනවිට ඔවුන්ට මුහුණ පාන්නට සිදු වී ඇති ගැටළු සහ සමාජ අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීමට කටයුතු කරන ආකාරය ආදිය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණු අතර විය. ඒ අනුව මෙම ගම්මානය තුළ වැඩිහිටියන් පමණක් නොව දරුවන්ද මුදල් ඉපයීම වෙත නැඹුරු වී සිටින බව හඳුනා ගත හැකිය. නගරයේ පාසලට මෙම දරුවන් ඇතුළත් කරන නමුදු පාසල තුළ ඔවුන් කොන්වීමක් හා හුදකලාවීමක් සිදුවන බව පැවසේ. එම නිසා ඔවුන්ගේ පාසල් ගමන අතරමගදී නවතා දමන අතර ඔවුන් වෙනුවෙන් ගම තුළ පවතින පාසලෙන්ද ඔවුන්ට නිසි අධ්‍යාපනයක් නොලැබේ. ගම්මානයේ සැලකිය යුතු මට්ටමක මාර්ග පද්ධතියක් පැවතියද වන අලි තර්ජන සහ ජල ගැටළුව ආදී නොවිසඳුන ප්‍රශ්න රාශියක් ඔවුන් සතුව ඇත. ඔවුන් තුළ පවතින ද්වාර කර්ම අවස්ථා හා අනෙකුත් චාරිත්‍ර වාරිත්‍ර විශාල වශයෙන් වෙනස්වෙමින් පවතින බව පැහැදිලිය. වර්තමානය වන විට සමාජ නවීකරණයත් සමඟ මොවුන් තමන්ට ආවේණිකව තිබූ කටයුතු වලින් බැහැරව විවිධ ස්ථාන වල කුලීකරුවන් ලෙස හා අත් උදව් කරුවන් වශයෙන් සේවය කරනු ලබයි. ඊට අමතරව හෙරොයින් වැනි මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම්, සොරකම්, මංකොල්ලකෑම්, ස්ත්‍රී දූෂණ, අපරාධ සහ අපචාරී ක්‍රියා වැඩි වශයෙන් ගම්මානය තුළ ව්‍යාප්ත වී ඇති බවක් දක්නට ලැබේ. ක්‍රිස්තියානි, බෞද්ධ, හින්දු ආදී ආගම් අදහන මොවුන් වර්තමානය වනවිට සිංහල මහ සමාජය සමඟ මුහු වීමට උත්සාහ කරන බවක් හඳුනාගත හැකිය. ගෙවල් දොරවල් සෑදීම, යාන වාහන, ඇඳුම් පැළඳුම්, භාෂාව, සංස්කෘතිකාංග ආදී සියල්ල වාණිජමය අරමුණු උදෙසා වෙනස් කර ගැනීමට නිරතුරු උත්සාහයක නිරතවන මොවුන් තම පාරම්පරිකත්වය අභිබවා යාමට කටයුතු කරමින් සිටී. සිංහල මහ සමාජය මොවුන් ප්‍රතික්ෂේප කරන අවස්ථා පැවතිමුත් පසුගිය සියවසේ 8-9 දශකවලට වඩා ඉහළ අගයකින් මොවුන් වර්තමානය හා සම්බන්ධ වෙමින් සිංහල සිරිත් විරිත් හා බද්ධ වී ඇත.

**ප්‍රමුඛ පද** - අහිකුණ්ඨික; තෙලිගු; කුඩාගම; සංස්කෘතිය; ද්වාර කර්ම